පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 492

நிறுவனத்தின் பெயர்: வனஜீவராசிகள் பாதுகாப்பு திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119.(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பார்ாளுமன்றத்துக்குச் சமர்ப்பித்தல்

Parliamentary Series No: 492

Name of the institution: Department of Wildlife Conservation

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ සභාගත කරන ලද වාර්තා සම්බන්ධ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම - 2023 මුදල් වර්ෂය

පාර්ලිමේන්තු නියෝග අංකය - 492

ආයතනයේ නම - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් හඳුනා ගන්නා ලද අඩුපාඩු	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය
පළමු කොටස : 87.00	
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම.	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ අංශ 16 ක්, පශු වෛද්‍ය ඒකක 08 ක් සහ කලාප කාර්යාල 12 ක්ද ඒ යටතේ අඩවි කාර්යාල, උද්‍යාන පිවිසුම් හා බීට්ටු කාර්යාල 195 ක්ද ස්ථාපිතව ඇති අතර, විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීමේදී සමහර අවස්ථාවල මෙම අංශ හා කලාප කාර්යාල වලින් ද තොරතුරු කැඳවිය යුතු වේ. එම තොරතුරු ලබා ගැනීමේ ප්‍රමාදයන් පවතින සමහර අවස්ථාවල මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොලැබෙන අවස්ථා ඇතිවේ. එවැනි අවස්ථාවන්හිදී අවසන් වාර්තාව ඉදිරිපත් කරන තෙක් අතුරු පිළිතුරක් යොමු කිරීමට කටයුතු කරනු ලබයි. සියලු අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සපයා නොමැති නමුත් හැකි සෑම අවස්ථාවකම මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කිරීම සිදු කර ඇති බව දන්වමි. මේ වනවිට සියළුම විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සැපයීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත.
2017.06.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබීම.	සමාලෝචිත වර්ෂයේදී වාහන මිලදී ගැනීම් හෝ අපහරණය කිරීම් නොමැති බැවින් අදාළ දැනුම් දීම සිදු කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර	නිසි පරිදි අදාළ වාර්තා විගණනය වෙත යොමු කරන අතර, මේ පිළිබඳව රජයේ විගණන අංශයද තහවුරු කරනු ලබයි.

නොනිබීම.	
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොනිබීම.	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විෂය පථයට අනුව වනජීවී අපරාධ සම්බන්ධයෙන් පුද්ගලයින් අත්ඩංගුවට ගැනීම් සහ නීති විරෝධී කටයුතු වැටලීම් හා විමර්ශන රාජකාරී ඉටු කරනු ලබයි. එබැවින් එම රාජකාරී සඳහා දෙපාර්තමේන්තුව සතු වාහන භාවිතා කිරීමට හැකිවන පරිදි රාජ්‍ය ලාංඡනය පින්තාරු නොකිරීමට කටයුතු කර ඇති අතර , එම වාහන අනෙකුත් සාමාන්‍ය රාජකාරී සඳහා යොදා ගැනීමේදී සෑම වාහනයකම දෙපාර්තමේන්තු නාම පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොනිබීම.	2020 වර්ෂයේ දී අපහරණ කටයුතු කිරීම සිදු කරමින් පැවති අතර, රජයේ වාහන මිලදී ගැනීම සීමා කිරීම හේතුවෙන් සිදු කරමින් පැවති වාහන අපහරණ කටයුතු තාවකාලිකව නතර කරන ලදී. ඒ අනුව අලුත්වැඩියා කර නැවත ධාවනයට යොදා ගත හැකි වාහන හඳුනා ගෙන එයින් ඇතැම් වාහන අලුත්වැඩියා කර මේ වන විට රාජකාරී සඳහා යොදවා ගෙන ඇත. අලුත්වැඩියා කළ නොහැකි ඉතිරි වාහන අපහරණ වාහන හඳුනා ගැනීමේ විශේෂිත කමිටුව මගින් හඳුනා ගෙන අවසන් කර ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු වාහන තක්සේරු කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොනිබීම	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ශේෂයන් පරීක්ෂා කර බලා නිවැරදිව හඳුනා ගැනීමෙන් පසු නිරවුල් කිරීමට කටයුතු කර ඇත. ආදායම් ඒකක 42 ක් මගින් හා මාර්ගගත ක්‍රමය (Online) යටතේ ආදායම් එකතු කිරීම සිදුවන බැවින් නිවැරදිව හඳුනා ගැනීමට යම් කාලයක් ගතවීම නිසා බැවින් මසක් තුල නිවැරදි කිරීමට නොහැකි වී ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොනිබීම	පොදු තැන්පත් ගිණුමේ වර්ෂ දෙක ඉක්මවා ඇති රජයේ ආදායමට බැර කල හැකි තැන්පතු හඳුනා ගෙන රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ඇතැම් තැන්පතු මු.රෙ 571 ප්‍රකාරවම එම කාර්යයන් නිම වන තෙක් තව දුරටත් තබා ගැනීමට කටයුතු කර ඇත.
ආයතනයට ලැබී තිබුණු විදේශාධාර සම්බන්ධයෙන් 1994.04.20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොනිබීම.	මෙම වක්‍රලේඛය ප්‍රකාරව ගිණුම්ගත කිරීම සඳහා එවැනි විදේශාධාර ලැබී නොමැති බවට අදාළ ප්‍රශ්නාවලියේම දක්වා ඇත. (ඇමුණුම 1)
විදේශ ප්‍රදාන ලෙස ලැබී තිබුණු සියලු මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ	එවැනි විදේශාධාර ලැබී නොමැත.

නිල බැංකු ගිණුම් වෙත ප්‍රේෂණය කර නොතිබීම.	
දෙවැනි කොටස : **80.00**	
මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබාදීම / ලබා නොදීම සම්බන්ධ විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබීම.	මෙය 2024 වර්ෂයේ සිට පවත්වා ගෙන යනු ලබයි.
ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබීම.	මේ වන විට ආයතනයේ වෙබ් අඩවිය මහජනයාගේ පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීමට හැකි වන පරිදි යාවත්කාලීන කර ඇත.මීට අමතරව දෙපාර්තමේන්තු සම්බන්ධීකරණ තොරතුරු වෙබ් අඩවියට ඇතුළත් කර ඇති අතර, හදිසි ඇමතුම් ලබා දීම සඳහා 1992 හදිසි ඇමතුම් අංකය පැය 24 පුරාම ක්‍රියාත්මක වේ.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	2023 විගණකාධිපති වාර්තාව අනුව ආයතනයේ ගිණුම් පිළිබඳව ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ පවතින බවට මතයක් ඉදිරිපත් කර නොමැති අතර, විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩු වලින් වන බලපෑම හැර 2023 වර්ෂය සඳහා වූ මුල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවට තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත. 2023 විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩු මේ වන විට නිවැරදි කර ඇත.
සියලු නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබීම.	2024 වර්ෂයේ සිට සියලුම නිලධාරීන් විසින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

වෛද්‍ය දම්මික පටබැඳි
පරිසර අමාත්‍ය